# මල්බර වසන්තයේ මා දුටු ජපානය 02

**විමලා විජේවර්ධන**
**කැන්ස්, ක්වීන්ස්ලන්තය.**

නිතරම ජනයාගෙන් පිරී ඉතිරී ගිය ෂිබුයා මංසන්ධියට, යාබදව එම දුම්රියපොළ දෙස බලා සිටින සුනඛයෙකුගේ ලෝහමය ප්‍රතිමාවකි. මෙම ස්ථානයට පැමිණෙන කවුරුත් පාසේ සානුකම්පිතව ගෞරවයෙන් යුතුව මෙම සුනඛයා දෙස බලා සිටිති. ටෝකියෝ විශ්ව විද්‍යාලයෙහි මහාචාර්යවරයෙකු වූ හිඩෙසාබරෝ යුඑනෝ hidges bauro ueano ගේ සුරතල් සුනඛයා "හචියෝ" (Hachio) මෙම පිලිරුවේ සිටින සුනඛයාය. දිනපතා ෂිබුයා දුම්රියපොළට අවුත් දුම්රියෙන් සේවය සඳහා යන යුඑනෝ නැවත සැන්දෑයාමයෙහි දුම්රියෙන් ෂිබුයා දුම්රියපොළට පැමිණෙයි. දිනපතාම සවසට (Hachio) හචියෝ, තම ස්වාමියා මුණ ගැසීමට නියමිත වෙලාවට මෙම ස්ථානයට පැමිණෙයි. තම ස්වාමියාගේ ආදරය මැද්දේ ඔහු සමඟ ආපසු නිවස බලායාම, දෙදෙනාගේම දෛනික සිරිත විය. එදා 1925 මැයි 21 සිරිත් පරිදි හචී සවස නියමිත වෙලාවට දුම්රිය පොළට ගියත්, යූ එනෝ නොපැමිණියේය. හදිසි හෘදයාබාධයකින් මහාචාර්යය යූ එනෝ විශ්ව විද්‍යාලයම මියගොස් අවසන්ය. ඒ කිසිවක් නොදත් හචී සුපුරුදු පරිදි තම ස්වාමියා එනතුරු බලා සිට අවසානයේ දී තනිවම ගෙදර ගියේ ය. පුරුද්දක් වශයෙන් සෑමදෑම ස්වාමියා හමුවීමට දුම්රියපොලට එන හචී ශෝකී මුහුණින් ආපසු නිවස බලා යයි. යුඑනෝ මියගොස් පුරා අවුරුදු දහයක් මෙය ඔහු අතින් සිදු විය. දන්නා අදුනන කවුරුත් ශෝකයට පත් කරමින් 1935 දී හචී මිය ගියේ ය. "ජාතික වීරයෙකු" ලෙස ඔහුම සැලකූ ජපන් ජාතිකයෝ, යුඑනෝගේ සොහොන් කොතට යාබදව ඔහු වෙනුවෙන්ද සොහොන් කොතක් සෑදිය. අවුරුදු පතා "හචී" වෙනුවෙන් අනුස්මරණ උත්සව පැවැත්වූහ. හොලිවුඩ්හි සම්මාන දිනාගත් ජනප්‍රිය නලු නිලියන්ගේ රංගන දායකත්වයෙන් "hachi - A dog's tale" නමින් ජනප්‍රිය චිත්‍රපටියක් රිදී තිරයට එකතු විය. 1948 දී ෂිබුයා දුම්රියපොළ ඉදිරිපිට ඔහු වෙනුවෙන් සෑදූ ස්මාරකයයි අදත් අපි නරඹන්නේ.

ගෝලිය සංසකෘතියෙහි අනුපමේය සංකේතයක් බවට 1869 නිමවූ පැරිස් නුවර අයිෆල් කුළුන පත් විය. වරින්වර මෙවැනි උස් කුළුනු ලෝකයේ විවිධ රටවල නිම වුණි. මීටර් 604 උස චීනයේ කැන්ටන් නුවර දැවැන්ත කුළුන පරදවා 2011 දී ජපන් ජාතිකයා "Tokyo sky tree", මීටර් 634 උස් කුළුනක් නිර්මානය කළේ "ජපනා හපනා" යන අප සිංහල කා අතරත් පවතින කථාව සනාථ කරමිනි. රූපවාහිනි හා සන්නිවේදන කටයුතු පහසු කිරීම, මෙය ගොඩනැගිමේ ප්‍රධාන පරමාර්ථය වූවත් වැඩිකල් නොගොස්ම මෙය ජනප්‍රිය සංචාරක මාධ්‍යස්ථානයක් බවට පත් විය. අප එහි යන විටත් එය නැරඹීමට විශාල ජනකායක් රැස්වී සිටියහ. කඩ සාප්පු, භෝජනාගාර, ආදියෙන් සපිරුණු මෙහි මීටර් 450 උස දෙවෙනි මහලටත්, මීටර් 350 උසැති පළමුවැනි මහළටත් යෑමට ජනතාවට ඉඩ පහසුකම් සලසා තිබුණි. මෙම මහල්වලට යෑමට ඇති විදුලි සෝපානය (Lift) තත්පර 45, වැනි සුළු මොහොතකින් අපට මීටර් 450 උස මහලට ගෙන ගියේ, අපි සැවෝම මවිතයට පත් කර වමිනි. එසේම සෝපනය තුළ එකවර විශාල පිරිසකට යා හැකි විය. කවාකාර ලෙස නිම වූ දර්ශන පථය දුර ඉතා හොඳින් පෙනෙන පරිදි උත්තල හැඩයෙන් යුත් වීදුරු වලින් නිම වී තිබුනි. මෙම දර්ශන පථයෙහි බිම එක කොටසක් ඝන වීදුරු අතුරා ඇත. එය යටින් නගරයේ ඇති සුවිසල් ගොඩනැඟිලි ඇතුළු පාරවල් මැනවින් විද්‍යාමාන වෙයි. නව තාක්ෂණ ඥානයේ උපරිම ඵල නෙලා ගන්නා ජපන් ජාතිකයා රාත්‍රියට මෙයට නියොන් විදුලි රැහැන් වලින් එන ආලෝකධාරාවලින් පුදුම සුන්දරත්වයක් ලබා දෙයි.

**සකුරා මල් පිපිලා-හර් පුදුමයි ගේ දොරකඩ නිල් වන පියසේ**

ජපන් ජාතිකයා තම අධිරාජයාට දක්වන්නේ විශේෂ ගෞරවයකි. ඉතාම ආරක්ෂිත ලෙස එතුමාගේ මාලිගය නිම වී තිබුණි. විශේෂ මුරකායන් ආරක්ෂාව නිතරම ගෙන දුන්නේ ය. ඔහුගේ මාලිගය වට කර තිබූ සුවිසල් උද්‍යානය සහ කෞතුකාගාර ආදිය මහජන ප්‍රදර්ශනය සඳහා වෙන්වූවත් ඔහුගේ මාලිගය ජනතා ප්‍රදර්ශනයට සඳහා නොයෙදුනි. අතිවිශේෂ පෞද්ගලික ජීවිතයක් ගත කරන ඔහු ජනතාව ඉදිරියට එන්නේ විශේෂ දිනයන්හි පමණක් බව අපගේ ජපන් ජාතික මාර්ග උපදේශිකාව පැවසුවාය.

ටෝකියෝවට පැමිණෙන සංචාරකයන්ට බැලිය යුතු දේ රැසකි. ටෝකියෝ නගරය සිසාරා ගිය අපි බොහෝ දේ දැක්කෙමු. නුමුත් ටෝකියෝවෙහි පරිනාමය අපි දැක්කේ එඩෝ (Edo) කෞතුගාරය නැරඹීමෙනි. ජපානයටත්, ටෝකියෝවටත්, තිබුණේ දුක්බර කටුක ඉතිහාසයකි. පුජියාම ගිනි කන්ද වරින් වර පුපුරා ඇති කළ මහා විනාශයන් සමඟම 1925 මහා භූමි කම්පාවකින් මුළු ටෝකියෝවම දෙදරීය. ෂෂ වන මහා ලෝක යුද්ධය ජපානයෙන් විශාල ප්‍රමාණයක් බිමට සමතලා කළේය. මෙම සියළුම බාධක මැද ජපානයෙත්, ටෝකියෝ නගරයෙත් නව උදාව අපි ඒඩෝ කෞතුකාගාරය තුළින් දැක්කෙමු.

1993 ඇති කල මහා කෞතුගාරය සුවිශේෂ ගෘහ නිර්මාණ ක්‍රමයකට සාදා ඇති සුවිසල් දෙමහල් ගොඩනැගිල්ලකි. නවීන තාක්‍ෂණ ශිල්පී ක්‍රම අනුව මෙහි සාදා ඇති විදුලි පියගැටපෙළ නව ස්වරූපයක් ගනී. වටින් ආවරණය කර ඇතත්, විනිවිද පෙනෙන පරිදි නිම කර ඇති මෙම එස්කලේටරය (Escalator) ඉතා වේගයෙන් ගමන් කරයි. අංශක 900 සමීප වන පරිදි එය සැකසී ඇත. මෙම කෞතුගාරයට ආසන්නව ඇති පෞරාණික පාලමේ (Nihombasi Bridge) ආකෘතියක් මෙහි තනා ඇති අතර එය සැබෑ පාලම තරමටම විශාලය. නරඹන්නන් හට පහසුවෙන් එහි ගමන් කළ හැක. ජපන් ජාතිකයන් විසින් අතීතයේ භාවිතා කළ විවිධ භාණ්ඩ ඇඳුම් පැළඳුම් නියම ප්‍රමාණයටම අනුරූප වන පරිදි සෑදූ පැරණි සාම්ප්‍රදායනු ජපන් නිවාස ඔවුන් පාවිච්චි කළ වැසිකිළි වැනි දේ මෙහි ප්‍රදර්ශනයට ඇති අතර ඒවා තුළට ගොස් බැලීමට වුවත් ඉඩ ප්‍රස්ථා ලබා දී තිබුණි.

ටෝකියෝ නගරයෙන් අප පිටත් වූයේ ෆියුජි කඳුවැටිය (Mount Fuji) නැරඹීමටය. නාගරීකත්වයෙන් ඉවත්ව, කඳුකර ප්‍රදේශයක් කරා අපේ බස්රිය ගමන් කළේය. ජපන් ජාතිතයන් ට මෙය පූජනීය ස්ථානයකි. ඒ නිසාම ඔවුන් "පියුජි සෑන්" යන ගෞරවනීය නමකින් (Fuji San) මෙම කන්ද අමතයි. ඈත අතීතයේ සිටම මෙය වන්දනා කිරීම ඔවුන්ගේ සම්ප්‍රදායක් විය. අදත් එය එසේම පවති. මීටර් 3776 උස මෙය ජපානයේ උසම කන්ද වෙයි. මෙම කන්ද අදටත් ක්‍රියාකාරීත්වයෙන් යුත් ගිනි කන්දකි. අතීතයේ වරින් වර මෙම කන්ද පිපිරුවද, 1707 පසු එවැන්නක් සිදු නොවිය. මෙම කන්දෙන් හටගත් ජල තටාක කිහිපයක් මෙය අවට පරිසරය සුන්දර කෙරුනි. ඒවා සියල්ලම වරන් වර පිපිරුන ගිනි කන්ද තුළින් සෑදූනු ඒවා විය. ඒ හැර කන්දෙහි හිම දිය වීමෙන් ඇතිවුන දර්ශනීය පොකුණුද මේ අතර අපට දැක ගත හැකි විය. නිතරම වලාකුළින් හා මීදුමෙන් වැසෙන මෙම කන්ද බොහෝ අවස්ථාවල පැහැදිලිව දැක ගත නොහැක. එදින මැනවින් හිරු පායා තිබුණි. කන්ද වටකර සිටින ඝන මීදුම් පටලයත්, වළකුළුත් එදා දක්නට නොතිබුණි. කඳු මුදුන, මැනවින් දර්ශනය වන, (5th station) දර්ශන තලයට (Look out) අපි වීමු. හිමෙන් වැසුනු කඳු මුදුනත්, එම හිම මත වැටුන උදා හිරු රැසින් නිකුත් වූ වර්ණවත් රශ්මිධාරාවක් අප සිත් වශී කළේය. උදයට පායන හිරු රැස් හා සමඟම සවසට බැසයන හිරු රැස් කන්ද සිසාරා ගොස් උඩට මතුවන්නේ දියමන්තියකින් පැන නඟින රශ්මි කදම්බයක් ලෙසිනි. මෙම අසිරිමත් දර්ශනය නිසා මෙම කන්දට දියමන්ති ෆියුජි (Diomond fuji) යනුවෙන් ද ජපන් ජාතිකයෝ අමතති.



19 වන පිටෙන්

සියවස් ගනනක් තිස්සේ
පරමාපරා ගණනාවක්
හෙලූ කඳුළු දහඩිය වල
වන්දි ගනින් පුතේ
**(ඉතිහාස පාඩමක්)**

1976 දී මෙසේ සමාජ සාධාරණය තරුණ පනාගොඩ කවියා ඉන් වසර හතළිහකට පසුත් නොවෙනස් ජවයකින් ඒ කාරණයම වෙනත් ආකාරයකට ලියන්නේ සාධාරණ සමාජයක් පිලිබඳ තවමත් නොසන්සිඳුණ බලාපොරොත්තුවක් හද දරා ගනිමින් ද?

දූවිලි අතරේ බත් ඇට ඇහිඳින
දරුවන් දෑතම දිගු කෙරුවේ
වැරහැලි තැවරුණ කෙසඟ සිරුරු ඇයි
පිළිකෙව් කර වෙනතක් බැලුවේ
**(සොහොන් කොතේ ගීතය)**

සම්මත කවියේ අප දකින උපමා රූපක වැනි අලංකාර කෙරෙහි මෛත්‍රී ඒ හැටි තැකීමක් නොකරන්නේ ඔහුට සිය නිර්මාණ මත මුද්‍රාහරින්නට ඇති සංවේදනාවේ අවංකත්වය නිසාම විය හැකි යයි මට සිතෙයි. එනිසාම මේ කවි නිර්ව්‍යාජ ය. ඒ සංවේදනා මුද්‍රාහැරීමේ දුෂ්කර ක්‍රියාවේ දී වරෙක මෛත්‍රී සඳැස් කවිය කෙරෙහි දක්වන ශක්‍යතාව ප්‍රදර්ශනය කරන ආකාරයද අපූරු ය.

තුරු අග හොටක රාගී ස්වර නැගෙන විට
තරු මල් වැලක් රෑ අහසේ දිලෙන විට
කරුවල රජ මැදුර ඔබ හද පෙළන විට
උරුමයි මා පිදූ සෙනෙහස මතක යට
**(බිසවට නොකී කවි)**

වපුරා කඳුළු දහඩිය කම්හල් බිමක
සපුරා ගෙන සිහින පෙර නුදුටුව ඉමක
උදුරා ගත් සිනා යළි ඉපදෙන ලොවක
සතුරා වුනත් කුළු පග වෙනු ඇත දිනක
**(විජාතික සබඳෙකුට)**

අද සමාජයේ අපට අත්දකින්නට ලැබී තිබෙන ව්‍යසනයක් බවට පත්ව ඇති භික්ෂූන් බෞද්ධ දර්ශනයේ හරය පසෙක ලා දේශපාලනයේ යෙදීම හා අන්ධ භක්තියකින් දේශපාලකයන් පසුපස දිව යාම පවා පනාගොඩ කවියාගේ දැක්මට අසුවී තිබෙන්නේ ඔහු කෙතරම් සැළකිල්ලෙන් සමාජය දෙස බලා සිටින්නේද යන්න තහවුරු කරමින් ය. ඔහු දිග කතාවක් කෙටියෙන් කියන්නේ "කහ සිවුර මඩ වෙලා මහ පිරිත නැවතිලා" කියා ය.

බෝ ගසේ සෙවන යට
නිරාමික සුවය මිස
ගිහි ලොවක දුකට නොව
බුදු පුතුනි ඔබ අයිති
(වැඳ අවසර)

කවිය යනු අපූර්ව කලා මාධ්‍යයකි. වරෙක අප හඬවන්නටත් වරෙක අප සිත සැනසුම නංවන්නටත් කවියට හැකි වන්නේ කවියා කවිය තුළ පෝෂණය කරන දැක්මත් ඒ දැක්ම ඉදිරිපත් කරන පරිනත විලාසයත් නිසා ය. දශක ගණනාවක ජීවන අත්දැකීම් අතරින් මෛත්‍රී පනාගෙඩ කවියා අපට කියන්නේ ජීවිතය බොහෝ දුක් තැවුල් වලින් පිරුණ ගමනක් යන්නම ය. ඒ බව කියන්නට ඔහුට ඇති ශක්‍යතාව පිලිබඳ හොඳම උදාහරණය "හද මුමුණන හඬ" යි.

